01

**Samodhana: The Journal of Humanities and Social Sciences**
2017, Vol.6 (III) 1-7pp
© The Author 2017
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට ගුරුවරුන් බඳවා ගැනීම.

ආචාර්ය බී.එම්.එස්. බණ්ඩාර[1]

## Abstract

Teacher profession is a recognized profession in many countries of all-over the World and teacher recruitment (enrollment) is an important process, because quality teachers are valuable recourses for the education system. The number of Sri Lankan teachers has grown in last five decades, according to the rise in student enrollment over the same time period. Teacher recruitment (enrollment) process in Sri Lanka has a long history and it was changed time to time, according to government policies. Formal teacher recruitment procedure was introduced to Sri Lanka in Dutch period, however in that period, the teacher recruitment power and authority had to the Churches. After gaining the independence from the British, Sri Lanka had various types of informal teacher recruitment procedures. Sri Lanka Teacher Service (SLTS) was established in 1990s and the teacher recruitment procedure was formalized. According to the SLTS minutes two types of teachers are recruited in the system, these are graduates and diploma holders from National Colleges of Education. Finally this paper articulates the teacher

[1] *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.* bandara@live.com

professional development and related issues in teacher professional development in Sri Lanka.

Key words: Teacher enrollment, government policies, Sri Lanka Teacher Service, National Colleges of Education,

**හැඳින්වීම**

අධ්‍යාපනය පිළිබඳ විවිධ නිර්වචන ඇති අතර "අධ්‍යාපනය යනු සංස්කෘතිය ඊ ළඟ පරම්පරාවට පවරාදීමයි" යන අදහස වඩාත් ප්‍රචලිතයි. සමාජය උරුමකරගත් දැනුම්, කුසලතා හා ආකල්ප සම්භාරය වන සංස්කෘතිය ඊළඟ පරම්පරාවට පවරාදීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන්නේ ගුරුවරයාය. මේ නිසාම ගුරුවරයා යන වෘත්තිකයා අතීතයේ සිටම ලෝකය පුරා පිළිගත්, සමාජයම ගරුකරන පුද්ගලයෙකු බවට පත්විය. ගුරු වෘත්තිය හා ගුරුවරයා පිළිබඳව විමසීමේදී එහි ඉතිහාසය මිනිස් ශිෂ්ටාචාරයේ ආරම්භය දක්වාම දිවෙන බව පෙනී යයි. "යමක් උගන්වන්නා ගුරුවරයෙකි." යන සරල සංකල්පයේ සිට වෘත්තීය සුදුසුකම් සහිත ගුරුවරයා යන සංකල්පය දක්වා ගුරුවරයාගෙන් වෘත්තිකභාවය පරිනාමනය වී ඇත. වර්ථමානයේදී ගුරුවරයා දැනුම පවරාදෙන්නෙකු පමණක් නොව දැනුම උත්පාදකයෙකු (Generation of knolwledge) වියයුතු බව පිළිගනියි.

**ගුරුවරුන් පාසල් පද්ධතියට බඳවා ගැනීම**

කෙසේ වෙතත් ගුරුවරයා යන වෘත්තිකයා වඩා හොඳින් හඳුනාගත හැක්කේ විධිමත් අධ්‍යාපන පද්ධතියක් තුළයි. එම පද්ධතිය තුළ ගුරුවරයා යනු කවරෙක්ද ? ඔහුට අයත් කාර්යභාරය කුමක්ද ? කළ යුතු දේ හා නොකළ යුතු දේ මොනවාද ? ඔහුගේ සේවය වෙනුවෙන් ගෙවන වැටුප කොපමණද ? ආදී වශයෙන් නිශ්චිත හඳුනා ගැනීමක් කළ හැකිය. ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සලකන විට ඈත අතීතයේ ඉගැන්වීම, උගතකුගේ යුතුකමක් ලෙස සැලකීය. මුදලක් මතම මෙම කාර්ය සිදු නොවීය. ගමක ගුරුවරයෙකුට හා වෛද්‍යවරයෙකුට (වෙද මහතාට) මේ අනුව විශාල පිළිගැනීමක් තිබුණි. පසුව මෙම වෘත්තීන් දෙකම වැටුපක් ලබන වෘත්තීන් බවට පත්විය. එතැන් සිට සමාජය තුළ

පිළිගැනීමේ අඩුවක් ඇතිවීම ආරම්භ විය. වර්තමානය වනවිට ගුරු වෘත්තිය ගෙවන වැටුපට වැඩකරන වෘත්තියක් බවට පත්විය.

ගුරුවරුන් පාසල් පද්ධතියට බඳවා ගැනීම ගැන සලකන විට අතීතයේ සිට එය විකාශනය වූ ආකාරය විමර්ශණය කිරීම ඉතාම වැදගත්ය. ශ්‍රී ලංකා අධ්‍යාපන ඉතිහාසය සලකන විට එය අධ්‍යයනයේ පහසුව සඳහා යුගයන් කිහිපයකට බෙදා ඇත.

1. විජයාවතරණයට පෙර යුගය
2. විජයාවතරණයේ සිට මහින්දාගමනය තෙක් යුගය
3. මහින්දාගමනයේ සිට පෘතුගීසීන්ගේ පැමිණීම තෙක් යුගය
4. පෘතුග්‍රීසි යුගය
5. ලන්දේසී යුගය
6. බ්‍රිතාන්‍යය යුගය
7. නිදහසින් පසු යුගය (වර්තමානය දක්වා)

විජයාවතරණයට පෙර යුගය සලකන විට අධ්‍යාපනය පිළිබඳ ලිඛිත සාක්ෂි සොයාගත නොහැකි අතර ඓතිහාසික ජනකථා ආශ්‍රයෙන් පෙනී යන්නේ යම්කිසි දියුණු මට්ටමක අධ්‍යාපනයක් ලංකාවේ තිබූ බවයි. උදාහරණයක් ලෙස විජය කුමරු ලංකාවට ගොඩබට පසු කුවේණි හමුවූ අතර ඇය කපු කටිමින් සිට ඇත. එනම් ඇඳුම් නිර්මාණය කරන කපු ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ අධ්‍යාපනයක් තිබී ඇත.

විජය රජු සමඟ පැමිණි පිරිස 700 ක් පමණ වූ බව ඉතිහාසයේ සඳහන් වෙයි. ඔවුන් අතර විවිධ කර්මාන්තවලට අදාළ හැකියාවක් හා අධ්‍යාපනයක් ඇති පිරිස් හා බමුණන් පිරිසක්ද ඒ අතර විය. විජය රජු රාජ්‍යය පාලනය කරන අවධියේ එම බමුණන් රජුට රාජ්‍ය පාලනය පිළිබඳ උපදෙස් දීමට අමතරව යාග හෝම ආදිය පිළිබඳව රටතුළ අධ්‍යාපනය ලබාදීම ආරම්භ වී ඇත. ඒ අනුව මුල්ම ගුරු වෘත්තිකයන් පිරිසක් ලෙස බමුණන් අපට හඳුනාගත හැක. විශේෂයෙන් ඔවුහු රජවරුන් ඇතුලු ප්‍රභූන්ට හා ඔවුන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදුන්හ. ඒ සඳහා අධ්‍යාපනය ආයතනය ලෙස ගුරුගෙදර හඳුනාගත හැකිය. එය බමුණන්ගේ නිවස වන අතර ගුරුවරුන් ලෙස කටයුතු කරන ලද බමුණන්

දිසාපාමොක් ලෙස හැඳින්වීය. ඒ අනුව අපිට මුලින්ම යම්කිසි නිශ්චිත නිලතාවයක් සහිත ගුරුවරයා දිසාපාමොක්ය. මෙම තනතුර හා ආයතනයේ ව්‍යුහය සම්පූර්ණයෙන්ම ඉන්දියාවෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතියට යොදාගත් භාරතීය ආකෘතියකි. අනතුරුව ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමෙන් පසුව ලංකාවේ ස්ථාපිත වූ බෞද්ධ අධ්‍යාපන පද්ධතිය තුල අධ්‍යාපන ආයතන වූයේ පන්සල, පිරිවෙන හා මහා විහාරයයි[2]. ඒවායේ ගුරුවරුන් ලෙස සේවය කළේ බෞද්ධ භික්ෂූන්ය. එකල පැවැති ඇගැයීම් ක්‍රම මගින් ඒ ඒ විෂය පිළිබඳ ප්‍රවීණ භික්ෂූන් වහන්සේලාට ගුරු පත්වීම් ලබාදී ඇත. මෙම භික්ෂූන් වහන්සේලා ගුරු වෘත්තිය කරන අතරතුර තමාගේ වැඩිදුර අධ්‍යාපන කටයුතුද මහා විහාර ආශ්‍රයෙන් කරගෙන යන ලදී.

පසුව ක්‍රි.ව. 1505 දී පෘතුග්‍රීසීන් ලංකාව ආක්‍රමණයෙන් (විශේෂයෙන් මුහුදු බඩ ප්‍රදේශ කොළඹ, ගාල්ල, යාපනය රාජධානි) පසුව ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පාසල් පද්ධතියක් පිහිටුවන ලදී. මෙම පාසල් පාලනය කරන ලද්දේ කතෝලික නිකායන් මගින් වන අතර ඔවුන් අදාළ පාසල්වල ගුරුවරුන් ලෙස පත්කරන ලද්දේ කතෝලික පූජකවරුන්ය. පසුව කතෝලික ගිහියන්ද ගුරුවරුන් ලෙස පත් කරන ලදී.

ලන්දේසි පාලන සමයේදී ගුරුවරුන් වූයේ රපරමාදු සභාවේ පූජකවරුන්, දේශකයින්, කතිකිස්ම ගුරුවරුන්, යුධ භටයන් සහ වෙනත් ගිහියන්ය. රෙපරමාදු නොවන කිසිඳු අයෙක් ගුරුවරුන් ලෙස පත්කරගන්නේ නැත. මුල් ගුරුවරුන් ලෙස තෝරාගත්තේ ගමේ පිළිගත් වැදගත් පවුලකින් පැවත එන උගත් අයෙකි. ඔහු හැඳින්වූයේ පල්ලියේ ගුරුන්නාන්සේ වශයෙනි. ඔහුට තෝම්බු දැමීමේ නිලධාරී ලෙස තනතුරක්ද ඒ සමඟම පිරිනමා ඇත. පාසල පාලනයට අමතරව ඔහුට පැවරුන කාර්යයන් වූයේ උප්පැන්න, විවාහ සහ මරණ ලියාපදිංචි කිරීම හා ඔප්පු ලිවීමේ නොතාරිස් කටයුතුය. ලන්දේසි යුගයේ පැරස් පාසල්වල ඉගැන්වීම සඳහා වැඩිහිටි සිසුන් බාල සිසුන්ට ඉගැන්වීමේ ශිෂ්‍ය ගුරු ක්‍රමය යොදාගනු ලැබීය. මෙකල ගුරුවරුන් සඳහා ඒකාකාර නිශ්චිත වැටුප් ක්‍රමයක් නොවීය. පාසලින් පාසලට, කලින් කලට ගෙවන වැටුප් විවිධ විය. සමහර ප්‍රදේශවල පාසලට දරුවන් නොඑවන

[2] මේවා එකල පැවැති තෘතීක අධ්‍යාපන ආයතනයයි. වර්තමාන විශ්වවිද්‍යාලවලට සමානයි. උදාහරණ:- අනුරාධපුර මහා විහාරය (ථෙරවාදී) අභයගිරිය, ජේතවනය (මහායානික)

දෙමව්පියන්ගෙන් අයකරගන්නා ලද දඩ මුදල් වලින්ම පමණක් ගුරු වැටුප් ගෙවූ බවට වාර්තා ඇත.

ක්‍රි.ව. 1948 පෙබරවාරි 04 දින ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබන විට අධ්‍යාපන පද්ධතිය ස්වදේශීය ආකෘතියට සකස් වූ පාසල් වලින් සමන්විත විය. 1950 වනවිට මධ්‍ය විද්‍යාල සංඛ්‍යාවේ 50 ඉක්මවා තිබුනි. මධ්‍ය විද්‍යාල ඇතුලු සියලු රජයේ පාසල්වල හා උපකෘත පාසල්වල ස්ථිර පත්වීම් ලත් ගුරුවරුන් සේවය කරන ලදී. මෙම ගුරුවරුන් බඳවා ගත් ආකාර කිහිපයක් තිබුනි.

1. ශිෂ්‍ය ගුරුවරුන් ලෙස

2. සාමාන්‍ය ගුරුවරුන්

3. උපාධිධාරී ගුරුවරුන්

නිදහස ලැබීමෙන් පසුව වුවද ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීමේ ජාතික ප්‍රතිපත්තියක් නොතිබුන අතර කාලයෙන් කාලයට, අවශ්‍යතාවය අනුව විවිධ නිර්ණායක මත ගුරුවරුන් බඳවාගෙන ඇත. 1950, 1960 හා 1970 දශකවල ශිෂ්‍ය ගුරු පත්වීම් ලබාදී ඇත. පාසල්වල ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් ළමුනට එම පාසලේම මෙලෙස ගුරුවරුන් ලෙස පත්වීම් ලබාදී ඇත. තවද අ.පො.ස. (සා.පෙ) සමත් අයට ගුරු පත්වීම් ලබා දී ඇත. ගුරුවරුන් ලෙස ප්‍රධාන වශයෙන් ගුරු වෘත්තියට ඇතුලත් වූ ක්‍රමය වූයේ මෙයයි. පසුව ඔවුන් ගුරු විද්‍යාලයක පූර්ණ කාලීනව අවුරුදු දෙකක් පුහුණු විය යුතුයි. පසුව පුහුණු ගුරුවරයෙකු ලෙස වැඩි වරප්‍රසාද සහිතව සේවය කරන ලදී. මේ කාලයේ උපාධිධාරී ගුරුවරුන්ද බඳවා ගැනීම සිදුවිය. ඔවුන් සඳහා විශ්ව විද්‍යාල මගින් වෘත්තීය පුහුණුව ලබාදෙන ලදී. ඒ අනුව විශ්ව විද්‍යාල තුල ගුරු පුහුණු පාඨමාලා ස්ථාපිත විය. (කොළඹ, පේරාදෙණිය, යාපනය) ගුරුවරුන්ට පත්වීම් ලබාදීමේදී දේශපාලන බලපෑම ආරම්භ වූයෙන් නිදහසෙන් පසුවය. විශේෂයෙන් 1970 දශකය වන විට පළාතේ මන්ත්‍රීවරයාගේ නම් ලැයිස්තුව පදනම් ගෙන සහතික ලත් (අ.පො.ස. (උ.පෙළ) සමත්) සහ සහතික නොලත් අ.පො.ස. (සා.පෙ සමත්) ගුරු පත්වීම් ලබාදෙන ලදී. 1980 දශකයේදී ගුරු පත්වීම් ලබාදීමේදී මෙතෙක් සිදුවූ දේශපාලන මැදිහත්වීමෙන් තොරව තරග විභාගයක් මගින් තෝරාගන්නා ලද ගුරුවරුන්ට පූර්ව සේවා පුහුණුවකින් (සති 3 ක) පසු ගුරු පත්වීම් ලබාදීම

ආරම්භ වී. විශේෂයෙන් 1980 දශකය වන විට ගුරු පත්වීම් ලබාදීමේ අවම සුදුසුකම් ලෙස අ.පො.ස (උ.පෙළ) සමත්වීම සලකන ලදී. (නමුත් ඉංග්‍රීසි, තාක්‍ෂණ, සෞන්දර්ය වැනි විශේෂ විෂයයන් සඳහා අ.පො.ස. (සා.පෙ) සමත් අයට ගුරු පත්වීම් ලබාදීම තවදුරටත් සිදුවිය.)

1980 දශකය වන විට උපාධිධාරි ගුරුවරුන් බඳවා ගැනීමටද තරඟ විභාග පැවැත්වීම ආරම්භ කරන ලදී. තවද 1980 දශකය අධ්‍යාපන ක්‍ෂේත්‍රයටද විශේෂ සංධිස්ථානයක් වන්නේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පළාත් සභා පිහිටුවීමයි. ඒ අනුව පළාත් සභාවලට ගුරුවරුන් පත්කිරීමේ බලයද ලැබුන නිසා පළාත් මට්ටමින් උපාධිධාරි ගුරුවරුන් පත්කරගැනීම ආරම්භ විය. 1980 දශකයේදීම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ පිහිටුවීමක් සිදුවීම නිසා ඒ තුළින් පිටවන පර්යේෂණ විද්‍යා ඩිප්ලෝමාධාරි ගුරුවරුන් ජාතික වශයෙන් කෙලින්ම පාසල්වලට පත්කරන නිසා අ.පො.ස. (උ.පෙළ) සමත් සහතික ලත් ගුරුවරුන් බඳවා ගැනීම ක්‍රමයෙන් අඩු විය.

1990 දශකය ගුරුවරුන් පත්කිරීමේදී ඉතාම වැදගත් දශකයකි. 1996 ආරම්භ කල ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් ශ්‍රී ලංකා ගුරු සේවය ආරම්භ විය. එතෙක් විවිධ පංති හා ශ්‍රේණි ලෙස හා සුදුසුකම් මත (උපාධි, උපාධි නොවන, පුහුණු නුපුහුණු ආදි) සේවය කරන ලද ගුරුවරුන් සියල්ලම ගුරු සේවයට අන්තරග්‍රහනය කරන ලදී. ඒ අනුව ගුරු වෘත්තියට පිළිගැනීමක් ඇතිවිය. වෙනත් පිළිගත් වෘත්තීන් (නීති, වෛද්‍ය, පරිපාලන, ඉංජිනේරු, විදේශ සේවා, විද්‍යාත්මක ආදි) මෙන්ම ගුරු වෘත්තියටද සමාජයේ වැදගත් වෘත්තීමය තත්වයක් ඇතිවිය. එයට සමගාමීයව ඉහළ වැටුප් තලයක්, බඳවා ගැනීමේ විධිමත් බාවයක්, උසස් වීම් පටිපාටියක් ආදි විශේෂ වාසිදායක තත්වයක් ඇති විය. ගුරු සේවය පිහිටුවීමත් සමඟ එම වෘත්තියට ඇතුලත් වවීමේ ක්‍රම දෙකක් පමණක් ඇතිවිය.

1. ජාතික විද්‍යා පීඨවලින් පිටවන ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතික සහිත ගුරුවරුන්ය.

2. උපාධිධාරි ගුරුවරුන් - උපාධිධාරි ගුරුවරුන් ජාතික හා පළාත් මට්ටමින් බඳවා ගන්නා අතර අධ්‍යාපනයේදී (BEd) කොළඹ විශ්ව විද්‍යාලය) උපාධිධාරීන් සෘජුවම බඳවා ගැනීම සිදුකරයි.

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ගුරුවරුන් බඳවා ගන්නා ආකාරය ඉහත පරිදිය. ඒ අනුව දේශපාලන පදනමකින් තොර දක්ෂ උගත් ගුරුවරුන් පද්ධතියට එක් වීම සිදුවෙයි. නමුත් ජාත්‍යන්තරව සලකා බලන විට තවදුරටත් නිශ්චිත අඩුපාඩුවක් වන්නේ උපාධිධාරීන් සෘජුව බඳවාගෙන (අධ්‍යාපනවේදී නොවන) ඔවුන් කිසිදු වෘත්තීය සුදුසුකමක් රහිතව පංතිකාමරයේ ඉගැන්වීමට යෙදවීමයි. කිසියම් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා ගුරුවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගයක් සමත් වුවද එම ගුරුවරුන් වෘත්තීය සුදුසුකම් රහිත ගුරුවරුන්ය. ඔවුන් වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරගැනීමට විශ්ව විද්‍යාල හෝ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් පවත්වන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (Postgraduate Diploma in Education - PGDE) පාඨමාලාව හැදෑරිය යුතුයි. ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නොවේ. උපාධිධාරී පත්වීමක් ලද පසුව ඔවුන් පෞද්ගලික අවශ්‍යතාවය මත කුමන හෝ කාලයකට පසුව මෙම පාඨමාලාව හදාරයි. සමහර අය එම පාඨමාලාව හැදෑරීම ආරම්භ කරන්නේ වසර 8 - 10 පමණ ගත වූ පසුවයි. එතෙක් කාලයක් ශිෂ්‍යයන්ට වෘත්තීය සුදුසුකම් රහිත ගුරුවරයකුගෙන් ඉගෙන ගැනීමට සිදුවේ. මෙය සුදුසුකම් රහිත වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ගැනීම හා සමානයි. ප්‍රතිඵලයද එක හා සමානයි. මේ නිසා උපාධිධාරී ගුරුවරුන් තෝරාගත් විගස ඔවුන්ට පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාලවලට හෝ ජාතික අධ්‍යාපන ආයතනයට යොමුකර පසුව පංතිකාමරයට යැවීම තුල යුතුයි. එවිට ශ්‍රී ලංකාවේ සාර්ථක ගුරුවරුන් බඳවාගැනීමේ පදනමක් පද්ධතිය තුල ස්ථාපිත වීම බලාපොරොත්තු විය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ජාතික අධ්‍යාපන ආයතනය (1989) **අධ්‍යාපනයේ ඓතිහාසික පදනම**, ගුරු අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

රංජිත් රුබේරු ටී. (1964) **ලංකාවේ අධ්‍යාපන පරිනාමය**, එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

සුමතිපාල්, කේ.එච්.එම්. (1993) **ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.